# කඳුකර කලාපයේ ජල උල්පත් විනාශ වීම කෙරෙහි බලපා ඇති හේතු පිළිබඳ අධ්‍යයනයක්

*ජයසූරිය කේ.ජේ.ජේ.එස්* [1] *පීරිස් එච්.ජී.එම්* [2] *ගුණරත්න ජේ.ඊ.එම්.සී.එල්.*[3]
*වික්‍රමරත්න ඩබ්ලිව්.ජී.ටී.ඩී.*[4]

මෑත කාලයේදී දක්නට ලැබුණු දැවැන්ත ව්‍යාපෘති අතර මහවැලි ව්‍යාපෘතිය ප්‍රධාන තැනක් ගනී. වියළි කලාපය සශ්‍රීක කරන්නටත් ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහාත් මෙකී මහවැලි ව්‍යාපෘතිය ඉතාමත් වැදගත් කාර්යභාරයක් ඉටුකරමින් ඇත. ජල මූලාශ්‍ර අතරින් ක්ෂුද්‍ර ජල මූලාශ්‍ර රාශියක් දක්නට ලැබෙන කඳුකර තෙත් කලාපයේ සිට මහවැලි ව්‍යාපෘතියේ ආරම්භය දක්නට ලැබේ. මෙම වටිනාකම භාවිතා කරමින් කොත්මලේ ජලාශය 1985 වර්ෂයේදී කඩිනම් මහවැලි ව්‍යාපෘතිය හරහා නිර්මාණය කරන ලදී. එහිදී කාලෝචිත අයුරින් ගත් ඇතැම් තීරණ වල පාරිසරක බලපෑමක් පවතින බව වර්තාමනය වන විට දක්නට ලැබේ. ප්‍රධාන වශයෙන්ම ජල උල්පත් සහිත ක්ෂද්‍ර ජල මූලාශ්‍ර සහිත මෙම කඳුකර ප්‍රදේශ තුළ පවතින පාරිසරික ගැටලු සහ බලපෑම් අධ්‍යයනය කිරීම මෙම අධ්‍යනයෙහි අරමුණක් ලෙස පෙන්වා දිය හැකිය. ජල පෝෂක ප්‍රදේශ කෙරෙහි අද වන විට එල්ලවී ඇති ප්‍රබල ගැටලු මොනවාද යන්න අධ්‍යනය කිරීම සහ එකී ප්‍රදේශ සංරක්ෂණය කිරීම සඳහා යොමුවිය හැකි ආකාරය පිළිබඳ අධ්‍යනය කිරීම මෙම අධ්‍යනයෙහි *උප* අරමුණු ලෙස පෙන්වා දිය හැකිය. කොත්මලේ ප්‍රදේශයේ ගොඩමඩිත්ත ග්‍රාමනිළධාරි වසමේ නව තිස්පනේ ගම්මානයට ගොස් සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රමවේදය සහ ප්‍රශ්නාවලි ක්‍රමය හරහා ප්‍රාථමික දත්ත මෙම අධ්‍යයනය සඳහා ලබාගත් අතර කොත්මලේ ව්‍යාපෘතිය සම්බන්ධ ව්‍යාපෘති යෝජනාව ද්විතීයික මූලාශ්‍රයක් ලෙස මෙකී අධ්‍යනය සඳහා භාවිතා කරන ලදී. මෙම ව්‍යාපෘතියට අනුව ජලාශය ඉදිකිරීමේදී බලපෑමට ලක්වූ ප්‍රදේශ සඳහා කොත්මලා ඔයට ඉහළින් පිහිටි කඳු සහිත ප්‍රදේශයේ නව ඉඩම් ලබා දීමක් සිදුකර තිබේ. අද වන විට නිවාස දියුණුවීමත්, වගාකටයුතු කුඹුරු වගාවේ සිට එළවළු සහ තේ වගාව සඳහා මාරුවීමත් සිදුවී ඇත. පවතින භූමියේ සීමිත බව සහ භූ විෂමතාවය ආදි කරුණු මත මෙම ජනතාව වී ගොවිතැන සිදු නොකරනු ලබයි. නමුත් කඳු සහිත මෙම ප්‍රදේශයේ පවතින ජල උල්පත් විශාල ප්‍රමාණයක් අද වන විට ගෘහාශ්‍රිත කටයුතු සඳහා භාවිතා කිරීමට හෝ වසා දැමීමට ජනතාව කටයුතු කර තිබේ. රජය මගින් නිසි ක්‍රියාමාර්ග නොගැනීම මත මෙම ජලාශයට ප්‍රධාන වශයෙන් ජලය සපයන කොත්මලා ඔය පෝෂණය වන ජල උල්පත් විශාල ප්‍රමාණයක් මේ හේතුවෙන් විනාශ වී ඇත. මෙම ප්‍රදේශයේදී මෙම ජල උල්පත් සහිත කලාපය දෙනිය යන නමින් හඳුන්වනු ලැබේ. මේ ප්‍රදේශයේ ජල උල්පත් 50 කට අධික ප්‍රමාණයක් සම්පූර්ණයෙන් වසාදමා ඇති අතර එම ප්‍රදේශ ගොඩකිරීමෙන් පසුව ගෙවතු ලෙස ප්‍රතිසංස්කරණය කර තිබේ. මෙම පාරිසරික බලපෑම වර්තමානයට සාපේක්ෂව ඉදිරියේදී ප්‍රබල ලෙස මුහුණදිය හැකි ගැටලුවක් ලෙස හඳුනාගත හැකිය. එමෙන්ම දෙනිය නමින් හඳුන්වන මෙම ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහා කුඹුක් පැළ වැනි ජලාධාර වලට හිතකර ශාක සිටුවීම තුළින් මෙම ජලාධාර ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතුය. එමෙන්ම ක්ෂුද්‍ර ජල මූලාශ්‍ර හා එහි වටිනාකම පිළබඳව ජනතාව දැනුවත් කළ යුතු බවද මෙම අධ්‍යයනයේදි පැහැදිලිවිය.

**ප්‍රමුඛ පද -** *කඳුකර තෙත් කලාපය, ක්ෂුද්‍ර ජලමූලාශ්‍ර, කොත්මලා ඔය, මහවැලි ව්‍යාපෘතිය, දෙනිය*

[123] පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.
jayasankajs11@gmail.com

[4] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.